# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**9 ශ්‍රේණිය**

**පෙරදිග සංගීතය - I/ II**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) දාදරා තාලයේ බලිය පිහිටන මාත්‍රාව
  1) 3  2) 4  3) 5  4) 2

02) මා පිය ගුණ වරුණ ගීතයක් නොවේ
  1) දුනුකෙයියා මලක්  2) ආදරයේ උල්පත
  3) සියක් ආයු ලැබ  4) රත්නදීප ජන්ම භූමි

03) ඡොටා ඛ්‍යාල් යනු
  1) මධ්‍ය ලය ගීතයි  2) ලක්ෂණ ගීතයි
  3) භජන් ගීතයි  4) සර්ගම් ගීතයි

04) බිලාවල් රාගයේ සියළුම ස්වර ශුද්ධ බව කියැවෙන ලක්ෂණ ගී ඛණ්ඩය
  1) සපිරුණු රතියේ  2) සුගැයෙන උදයේ
  3) ජනක බිලාවල  4) හැම ස්වර සුදු වේ

05) ඇතැම්විට දොහොරාවක් සහිත ගීත විශේෂයකි.
  1) ලක්ෂණ ගී  2) සර්ගම්  3) නූර්ති ගී  4) කෙළි ගී

✶ **මෙම ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

06) රාගයකට අදාළව සැකසුණු ස්වර අභ්‍යාස පල්ටා ලෙස නම් කරයි. (  )

07) සංවාදී ස්වර යනු රාගයකට නොයෙදෙන ස්වරයයි. (  )

08) විදුලි ඕගනය සුෂිර වාද්‍ය භාණ්ඩයකි. (  )

09) එකෝඩියනය යතුරු පුවරු සංගීත භාණ්ඩයකි. (  )

10) ඨාට කර්ණාටක සංගීතයේ දී මේල නමින් හඳුන්වයි. (  )

✶ **නිවැරදි ලෙස යා කරන්න.**

| | |
|---|---|
| 11) ස, රි, ග, ප, ධ, ස් ආරෝහණ ස්වර වේ. | බිලාවල් රාගය |
| 12) වාසනා දිනේකි මේක පාමු තුටින් ගීතය | දීප්චන්දි තාලය |
| 13) ස, රි, ග, ම, ප, ධ, නි, ස් ලෙස ආරෝහණය වේ. | භූපාලි රාගය |
| 14) මුළු ගතම වෙහෙසුනා ගීතය | නූර්ති ගීයකි |
| 15) මාත්‍රා 14කින් සමන්විතය | ගුවන්විදුලි කණ්ඩායම් ගීයකි |

✶ **නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

**(තබ්ලාව / සර්පිනාව / භූපාලි / පකඩ් / ඕගනය)**

16) දේ සෙත රාගිනියේ ලෙස ඇරඹෙන්නේ ……………………… රාගයේ ලක්ෂණ ගීතයයි.

17) සිංගල් රීඩ්, ඩබල් රීඩ් ලෙස …………………………… වර්ග වේ.

18) නූර්ති ගී ඉදිරිපත් කිරීමේ දී ……………………………… යොදා ගනී.

19) මුඛ්‍යාංගයට භාවිතා කරන හින්දි නම ……………………….. නම් වේ.

20) යමහා, කැසියෝ ලෙස වෙළඳපොලේ දක්නට ලැබෙන්නේ ………………………… නම් භාණ්ඩයයි.

## II කොටස

**තෝරාගත් ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01) පහත දැක්වෙන්නේ රාගාශ්‍රිත පාරිභාෂික වචන කීපයකි. ඉන් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

- i. වාදී ස්වරය
- ii. වර්ජිත ස්වර
- iii. අනුවාදී ස්වර
- iv. ජාතිය

(ල 12)

02) භූපාලි රාගයේ හෝ බිලාවල් රාගයේ ඔබ උගත් සර්ගම් ගීතය නිවැරදි තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.
(ල 12)

03)
- i. ශ්‍රී ලංකා ගුවන්විදුලිය ආශ්‍රිතව ගොඩනැගුණු කණ්ඩායම් සංගීතය පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ල 8)
- ii. ඔබ දන්නා කණ්ඩායම් ගීත හතරක් නිදසුන් ලෙස දක්වන්න. (ල 4)

04)
- i. සර්පිනාව හෝ එකෝඩියනය පිළිබඳව වාක්‍ය 4ක් ලියන්න. (ල 8)
- ii. ඔබ තෝරා ගත් සංගීත භාණ්ඩයේ කොටස් දෙකක් නම් කරන්න. (ල 4)

05) පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය ලියා ඇත්තේ ෂඩ්ජ භාවයෙනි. එය මධ්‍යම භාවයට පරිවර්තනය කර ලියන්න.

| ග - ම | ප - ග | ම - ග | රි - - |
| ග - ම | ප - ධ | නි - - | - - - |
| ධ - නි | ස් - ධ | ප - මග | රි - - |
| ප - රි |ග - රි | ස - - | - - - |

06) ඔබ උගත් නව නාට්‍ය ගීයක් හෝ නූර්ති ගීයක් ලියන්න. (ල 12)

07)
- i. බටහිර සංගීතයේ එන ස්කේල හඳුන්වන්න. (ල 2)
- ii. C Major ස්කේලයට අයත් ස්වර අපරදිග ස්වර වලින් ලියා දක්වන්න. (ල 10)
- iii. ඔබ ඉගෙනගත් තවත් ස්කේලයන් දෙකක් නම් කරන්න. (ල 2)

08)
- i. අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයේ දී ඒවා ප්‍රධාන කොටස් 3කට බෙදේ. එම කොටස් තුන නම් කරන්න. (ල 6)
- ii. ඒ සෑම කොටසකටම නිදසුන් සංගීත භාණ්ඩ දෙක බැගින් දක්වන්න. (ල 6)